ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.2 ඡේදයේ (ච), (ජ), (ට) හා (ඩ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.7 ඡේදය අනුව මහා නගර සභාව පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.29 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රමාණය ගණනය කිරීමේදී ආයෝජන ලෙස රු. 50,245,565 ක් ගැලපිය යුතු වුවද, රු. 41,126,851 ක් ලෙස ගලපා තිබුණු අතර මුදලින් ලැබී තිබුණු රු. 6,620,945 ක ආයෝජන පොළිය රු. 17,902,022 ක් ලෙස දක්වා තිබුණි.	නිවැරදිව ශේෂ ගිණුම්ගත කිරීමට සටහන් කර ගන්නා බව.	ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.32 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ගැලපීම් ලෙස රු. 10,668,078 ක් එකතු කර තිබූ නමුත් එම වටිනාකම සැදුම්ලත් ආකාරය ඉදිරිපත් කර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඇ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.30 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍යකරණ ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස රු. 114,512,019 ක් ගැලපිය යුතු වුවද රු. 47,348,231 ක් ගලපා තිබුණි.	පිළිතුරු සපයා නොමැත.	ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ)	ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදයේ 6.4 ඡේදයට පටහැනිව 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කර නොමැති කොන්ත්‍රාත්වල කළ වැඩ වටිනාකම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් එම ව්‍යාපෘතිවල ගිවිසුම්ගත වටිනාකම වන රු. 64,211,217 ක් ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි.	ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව කෙරීගෙන යන වැඩ හා ප්‍රාග්ධනිත කළ යුතු වැඩ වෙන්වෙන්ම හඳුනාගත යුතුය.
(ඊ)	ප්‍රමිතියේ 9 වන පරිච්ඡේදයේ 9.5 ඡේදය ප්‍රකාරව වියදම දැරීම සඳහා වන රජයේ පැවරුම් එවැනි වියදම් හඳුනාගන්නා කාලපරිච්ඡේදයේ අයභාරය ලෙස හඳුනා ගැනීමේදී, ක්ෂය වියදම හඳුනා ගැනීමට හීන වන ශේෂ ක්‍රමය භාවිතා කළයුතු නමුත් සරල මාර්ග ක්‍රමය භාවිතා කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව ක්ෂය ගණනය කිරීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පෙර වර්ෂවලට අදාළව ලද පොළී ආදායම් රු. 11,059,301 ක් වර්ෂයේ පොළී ආදායම තුළ ගලපා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.	ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව.	වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොළී ආදායම රු. 624,700 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර ලැබිය යුතු පොළිය රු. 19,269 ක් අඩුවෙන් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ දක්වා තිබුණි.	ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව.	ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ස්ථාවර වත්කම්වලට අදාළ ක්ෂය ගිණුම්ගත කිරීමේදි රු. 3,490,790 ක් අඩුවෙන්ද රු. 5,543,046 ක් වැඩියෙන් ද දක්වා තිබුණි.	ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව.	නිවැරදිව ක්ෂය ගණනය කර ගිණුම්ගත කළ යුතුය.

(ඇ)	උත්සව ශාලා කුලී ආදායම් ලේඛන අනුව ගිණුම් නොතැබීම නිසා වර්ෂයේ ආදායම සහ ලැබිය යුතු ශේෂය රු. 700,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.	ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව.	ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	දැන්වීම් පුවරු ආදායම රු. 87,875 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.	ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව.	ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂය තුළ ලද උසාවි දඩ ආදායම රු. 25,862,717 ක් වරෙන්තු හා අධිභාර ගිණුම යටතේ දක්වා තිබුණි.	ජනල් සටහන් මඟින් නිවැරදි කරන බව.	ආදායම් නිවැරදි ආදායම් ශීර්ෂ යටතේ ගිණුම්ගත කළ යුතුය.
(උ)	පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් රු. 146,670 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ජනල් සටහන් මඟින් නිවැරදි කරන බව.	නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(ඌ)	මාර්ග සංවර්ධනය සඳහා දරන ලද රු. 17,592,831 ක් ගොඩනැගිලි යටතේ ද පරිගණක මිලදී ගැනීම් රු. 1,245,527 ක් යන්ත්‍ර යටතේ ද දක්වා තිබුණි.	ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව.	නිවැරදි වත්කම් ගිණුම් යටතේ ගිණුම්ගත කළ යුතුය.
(එ)	ඔබේසේකරපුර පිහිටි ප්‍රජා ශාලාවේ අලුත්වැඩියා සඳහා වැය කරන ලද රු. 2,329,150 ක් වූ වියදම ප්‍රාග්ධනිත කර තිබුණි.	ජනල් සටහන් මඟින් නිවැරදි කරන බව.	ප්‍රාග්ධන හා පුනරාවර්ථන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඒ)	ඔබේසේකරපුර සමිති ශාලා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ණයහිමි වශයෙන් රු. 999,136 ක් වැඩියෙන් වෙන්කර තිබුණි.	ජනල් සටහන් මඟින් නිවැරදි කරන බව.	අධි වෙන්කිරීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඔ)	වර්ෂය තුළ කලින් ලද කර්මාන්ත බදු රු. 76,500 ක් ගිණුම්ගත කර නොතිබුණි.	ජනල් සටහන් මඟින් නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඕ)	ණයහිමි ශේෂයන් තුන්වරක් සටහන් වීම හේතුවෙන් ණයහිමියන් රු. 36,916,266 කින් ද වියදම රු. 324,000 කින් හා ගොඩනැගිලි වටිනාකම රු. 36,592,266 කින් ද වැඩියෙන් දක්වා තිබුණි.	ජනල් සටහන් මඟින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.
(ක)	ගිනි නිවීමේ ඒකකයට ආරක්ෂිත ඇඳුම් කට්ටල 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද රු. 1,121,000 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	ජනල් සටහන් මඟින් නිවැරදි කරන බව.	නිවැරදි වත්කම් ගිණුම් යටතේ ගිණුම්ගත කළ යුතුය.

(ග)	2024 වර්ෂය තුළ රු.306,800 ක් වටිනා වතුර ටැංකියක් නිකුත් කර තිබියදී තොග වටිනාකමින් ඉවත් නොකිරීම හේතුවෙන් වර්ෂය අවසන් තොග ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.	ජනල් සටහන් මගින් නිවැරදි කරන බව.	භෞතිකව සත්‍යාපනය කළ තොග වටිනාකම් මූල්‍ය ප්‍රකාශවල දැක්විය යුතුය.
(ච)	2023 වර්ෂයේ නිරීක්ෂණය කරන ලද අඩුපාඩුව සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී තොග ගිණුම රු. 605,400 ක් වැඩියෙන් බැර කර තිබුණි.	ජ'නල් සටහන් මගින් නිවැරදි කරන බව.	වැරදි නිවැරදි කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ජ)	2023 වර්ෂයේ නිරීක්ෂණය කරන ලද ජනපය සිටි සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීම් සම්බන්ධයෙන් ගෙවා නොමැති රු. 35,738,704 ක් වූ බිල්පත් ශේෂයට අදාළව ගෙවා තිබුණු රු. 31,120,027 ක ප්‍රමාද පොළිය ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමේදී ගොඩනැගිලි ගිණුම හර කර තිබුණි.	නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	වැරදි නිවැරදි කිරීම් නිවැරදි ගිණුම් වර්ගීකරණය යටතේ සිදු කළ යුතුය.
(ට)	2023 වර්ෂයේ නිරීක්ෂණය කරන ලද ලැබිය යුතු වරිපනම් ශේෂය වන රු. 466,539 කට අදාළ නිවැරදි කිරීම සමාලෝචිත වර්ෂයේදී ද සිදු කර නොතිබුණි.	ජනල් සටහන් මගින් නිවැරදි කරන බව.	වැරදි නිවැරදි කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඩ)	පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී රු. 6,481,525 ක ණයහිමියන්, විවිධ ණයහිමි හා ගබඩා ණයහිමි ගිණුම් දෙකෙහිම ගිණුම්ගත කර තිබීම ප්‍රවර්තන වර්ෂයේ නිවැරදි කර නොතිබුණි.	ජනල් සටහන් මගින් නිවැරදි කරන බව.	වැරදි නිවැරදි කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 15 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු. 47,213,952 ක වෙනසක් විය.	2025 අගෝස්තු 31 ට පෙර සියළු ගිණුම් නිවැරදි කරන බව.	වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 02 කට අදාළ වටිනාකම රු. 2,175,351 ක් සෑදුම්ලත් ආකාරය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරි කටයුතු සිදු කරන බව හා සෑදුම්ලත් ආකාරය ඇමුණුම මගින් ඉදිරිපත් කර ඇති බව.	වටිනාකම් සෑදුම්ලත් ආකාරය ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645	සභාවේ රියදුරන් විසින් දෛනික ධාවන සටහන් පොත් නිසි පරිදි සටහන් තබා නොතිබීම හේතුවෙන් වාහන සඳහා වූ ඉන්ධන පරිභෝජනය පිළිබඳ ගැටළුකාරී තත්වයක් මතුවී තිබුණි.	රියදුරන් දැනුවත් කර ඇති අතර GPS පරීක්ෂාව මඟින් ඉන්ධන පිළිබඳව අවබෝධය ලබා ගන්නා බව.	මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය	ධාවන සටහන් පොත්වල ධාවනය සඳහා පිටවූ වේලාව හා පැමිණි වේලාව, සැතපුම් ගණන කිසිදු විටෙක සටහන් කර නොතිබුණු අතර වාහනය පාවිච්චි කරන නිලධාරියාගේ කෙටි අත්සන ද යොදා නොතිබුණි.	සියළු රියදුරන්ව දැනුවත් කර ධාවන සටහන් නිසි පරිදි සම්පූර්ණ කර ඇත්නම් පමණක් ඉන්ධන නිකුත් කිරීම සිදු කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මු.රෙ 371(5)	සභාවෙන් නිකුත් කර තිබුණු රු. 851,300 ක අත්තිකාරම් නියමිත දිනට පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී මෙවැනි ප්‍රමාද වීම් සිදු නොකරන බව.	චක්‍රලේඛය හා මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	2016 අප්‍රේල් 28 දිනැති අංක LGD/04/2016 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය	වටිනාකම රු. 190,000,000 ක් වූ ස්ථාවර තැන්පත් නැවත නිදහස් කිරීමේදී චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.	චක්‍රලේඛයට පටහැනි ක්‍රියාවක් නොවන බව.	චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය අනුමැතිය ලබාගත යුතුය.
(ඉ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(ආ) ඡේදය	ගිනි නිවීම් ආරක්ෂිත ඇඳුම් කට්ටල මිලදී ගැනීම සඳහාවූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ විෂයය දැනුමක් ඇති නිලධාරියෙකු නොසිටීම නිසා ගිනි නිවීමේ සේවා දෙපාර්තමේන්තුවේ ස්ථානභාර නිලධාරී මහතාගේ පරීක්ෂාවට ලක්කර රු. 1,121,000 ක් වූ ගිනි නිවීම් ආරක්ෂිත ඇඳුම් කට්ටලය මිලදී ගෙන තිබුණි.	මිල මෙන්ම තත්වය පිළිබඳව මූලික අවධානය යොමු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඊ) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ			
(i) 1.2.1 ඡේදය	ගිනි නිවීම් ආරක්ෂිත ඇඳුම් කට්ටල මිලදී ගැනීමේ දී තෝරා ගනු ලැබූ ආයතනයට වඩා ප්‍රතික්ෂේපිත ආයතනය සෑම අවශ්‍යතාවයන්ගෙන්ම ඉදිරියෙන් සිටි අතර තෝරාගත් ආයතනයෙන් මිලදී ගත් නිසා සභාවට රු. 630,000 ක් වැඩියෙන් ගෙවීමට සිදුවී තිබුණි.	ආරක්ෂාව, ඉටුකරනු ලබන කාර්යය පිළිබඳව ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කර ඇති බව.	ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii) 7.7.1 ඡේදය	තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවම මිල තෝරා නොගැනීමට හේතුව නොදක්වා වැඩි මිල නිර්දේශ කර තිබීම නිසා යකඩ අයිතමයන් මිලදී ගැනීම සඳහා රු. 1,137,476 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.	ඇගයීම් කමිටුවක් විසින් අවම මිල, ගුණත්වය හා සන්නාමය පිළිබඳව සලකා බලා සභාවට වඩාත් සුදුසු සැපයුම්කරුවන් තොරාගෙන ඇති බව.	ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 308,552,531 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 210,290,184 ක් විය.

2.2 මූල්‍ය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව හඳුනානොගත් ගෙවීම් රු. 2,088,267 ක් හා හඳුනානොගත් ලැබීම් රු. 7,544,411 ක් හඳුනාගෙන ගිණුම්වලට ගලපා නොතිබුණි.	මෙම ගෙවීම හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය. .
(ආ)	බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව මාස 06 ඉක්ම වූ ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම රු. 667,012 ක් හා නිෂ්කාශනය නොවූ රු. 2,591,389 ක් ගිණුම්වලට ගලපා නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	ආදායම් ප්‍රභවය	2024 ඇස්තමේන්තුගත ආදායම	2024 බිල්කළ ආදායම	2024 රැස්කළ ආදායම	2024 දෙසැ.31 දිනට මුළු හිඟය	2023 ඇස්තමේන්තුගත ආදායම	2023 බිල් කළ ආදායම	2023 රැස්කළ ආදායම	2023 දෙසැ.31 දිනට මුළු හිඟය
		රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
(i)	වරිපනම් හා බදු	298,500	294,287	276,448	214,812	283,200	268,546	279,125	197,088
(ii)	කුලී	92,177	142,253	83,658	115,323	100,073	72,890	72,339	45,619
(iii)	බලපත්‍ර ගාස්තු	60,477	54,252	54,916	-	38,476	42,215	42,215	-
(iv)	වෙනත් ආදායම්	233,410	143,853	172,196	2,041	1,344,534	629,122	632,330	4,192
	එකතුව	684,564	634,645	587,218	332,176	1,766,283	1,012,773	1,026,009	246,899

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
(i)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයවිය යුතු වරිපනම් ශේෂය රු. 183,820,792 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව එය සියයට 10 කින් වැඩිවී තිබුණි.	වරිපනම් සංශෝධනය හේතුවෙන් ගාස්තු සියයට 250 කින් වැඩි වීම මත වරිපනම් හිඟය වැඩි වී ඇති බව.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	සභා බල ප්‍රදේශය තුළ පැවති සිනමා ශාලාවෙන් අයවිය යුතු රු. 2,781,679 ක් වූ විනෝද බදු ශේෂය 2019 වර්ෂයේ සිට අයවිය යුතුව පැවැතිණි.	හිඟ විනෝද බදු මුදල් කපා හැරීම සඳහා නිර්දේශය ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**කුලී**		
(i)	සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු කඩකුලී ආදායම රු. 115,323,795 ක් විය.	ඉදිරි වසරේදී හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	ජනජය සිටි සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 276 කින් ලැබිය යුතු ශේෂය රු. 37,362,861 ක් විය.	ඉදිරි වසරේදී හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(iii)	කඩ කුලී සඳහා නව තක්සේරු කිරීම් අනුව බිල් කිරීම් වටිනාකම රු. 84,498,576 ක් ආදායම් ප්‍රකාශයට හඳුනාගෙන තිබුණද, ලැබිය යුතු ශේෂය වූ රු. 70,203,357 ක් අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් පවතී.	නව තක්සේරුව මේ වන විට සභාවට ලැබී ඇති අතර ඉදිරියේදි ක්‍රියාත්මක වීමට නියමිත බව.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ මුද්දර ගාස්තු රු. 600,000,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී අයවිය යුතු මුද්දර ගාස්තුව රු. 245,135,400 ක් විය. තවද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට උසාවි දඩ රු. 3,677,906 ක් අයවිය යුතුව පැවතුණි.	හිඟ උසාවි දඩ අයකිරීමට කටයුතු කරන බව.	ප්‍රමාදයකින් තොරව ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සභාවේ කර්මාන්ත අංශය විසින් සිදුකළ යුතු කාර්යයන්ට අදාළව ප්‍රධාන නාගරික ඉංජිනේරු සහ නාගරික ඉංජිනේරු විසින් අත්තිකාරම් වශයෙන් ලබාගෙන තිබුණු රු. 770,370 ක් පියවීමේදී හා පෞද්ගලිකව වැය කර තිබූ රු. 352,940 ක් ප්‍රතිපූර්ණය කිරීමේදී ඉදිරිපත් කර තිබූ බිල්පත් අතරින් පිළිවලින් රු. 554,520 කට හා රු. 53,575 කට අදාළ බිල්පත් ව්‍යාජ බිල්පත් බව අනාවරණය විය.	කමිටුවක් පත්කර ඇති අතර කමිටුවේ මූලික පරීක්ෂණය අනුව ඉදිරියේදී කටයුතු කරන බව.	විමර්ශන පවත්වා විනයානුකූලව කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගිනි නිවීම් සේවා ඒකකය සඳහා තල්ලු කර විවෘත කරන ගේට්ටුව සහිත මායිම් තාප්පය සහ යකඩ වැට ඉදිකිරීම් ව්‍යාපෘතියේ කළ වැඩ වටිනාකම මත කොන්ත්‍රාත්කරු එකඟ වූ අගය රු. 3,891,750 ක සිට රු. 4,199,437 දක්වා ඉහළ ගොස් තිබුණ ද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 මාර්ගෝපදේශය අනුව විචලන නියෝග පිළියෙළ කර නාගරික කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. එමෙන්ම පත්කර තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටුව 2.8.4 මාර්ගෝපදේශය ප්‍රකාරව වූ කමිටුවක් නොවූ අතර 2.7.5 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදනය කමිටුවක් ද පත් කර නොතිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් දෙවන අවම මිල සහිත ලංසුව නිර්දේශ කර තිබුණද, අවම මිල ප්‍රතික්ෂේප කිරීමට සාධාරණ හේතු ඉදිරිපත් කර නොතිබුණි.	අවිනිශ්චිත වියදම් සීමාව තුළ පවතින බැවින් ඇස්තමේන්තු සංශෝධනය කිරීමක් අවශ්‍ය නොවන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	රජයේ ආධාර යටතේ 2017, 2019 සහ 2021 වර්ෂයන්ට අදාළ ව්‍යාපෘති වෙනුවෙන් දිගින් දිගටම පැවත එන ලැබිය යුතු රු. 23,287,498 ක ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	නිවැරදි ශේෂ හඳුනාගෙන ජනල් සටහන් මඟින් ගැලපීම සිදු කරන බව.	හිඟ ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාව වෙත දීර්ඝ කාලයක සිට ලැබිය යුතු එකතුව රු. 290,919,869 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2025 අගෝස්තු 31 දිනට පෙර පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව.	ප්‍රමාදයකින් තොරව හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) පහත සඳහන් විස්තර විගණනයට ඉදිරිපත් කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයේ ලැබිය යුතු වැට් ශේෂය ලෙස පැවති රු. 75,270,927 ක ශේෂය වර්ෂය අවසානයේදී රු. 39,997,137 ක් දක්වා අඩු වූ ආකාරය	වැට් ගිණුමේ ඇති වෙනස 2025 අගෝස්තු 31 දිනට පෙර ඊට අදාළ ගිණුම නිවැරදි කරන බව.	වටිනාකම් සැදූමලත් ආකාරය ඉදිරිපත් කළ යුතුය.
(ii) දේපල පිරියත උපකරණ මිලදී ගැනීම යටතේ 2024 වර්ෂය තුළ අත්පත් කරගෙන තිබුණු රු. 223,679,512 කින් රු. 120,328,061 ක් වූ ස්ථාවර වත්කම් අත්පත් කර ගත් ආකාරය	ඉදිරිපත් නොකළ වටිනාකම වන රු. 120,328,061 ක මුදල සම්බන්ධයෙන් තොරතුරු 2025 අගෝස්තු 31 දිනට ප්‍රථම හඳුනාගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	වටිනාකම් සැදූමලත් ආකාරය ඉදිරිපත් කළ යුතුය.
(iii) මූල්‍ය ප්‍රකාශනවල 2024 දෙසැම්බර් 31 දිනට දක්වා තිබුණු රු. 185,765,056 ක් වූ තොග ශේෂයෙන් රු. 141,576,136 කට අදාළ තොග සත්‍යාපන ලේඛන	මෙම වෙනසට හේතු හඳුනාගෙන ඇති අතර එම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව.	වෙනසට හේතු හඳුනාගෙන විගණනයට තහවුරු කළ යුතුය.

3.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ජනජයසිටි වෙළඳ සංකීර්ණය ඉදිරිපිට රථ නැවතුම් ස්ථානය, නගර සභාව ඉදිරිපිට රථ නැවතුම් ස්ථානය හා රාජගිරිය ගාඩ්න්ස්, බුත්ගමුව පාර, වැපල් පාර යන රථ නැවතුම් ස්ථාන ආදායම් රැස් කර ගත හැකි ස්ථාන ලෙස සංවර්ධනය කර නොතිබුණි.	සියලු රථ ගාල් සඳහා අවස්ථා දෙකකදී ටෙන්ඩර් කැඳවූ නමුත් කිසිදු ඉල්ලුම්කරුවකු පැමිණ නොමැති බව හා ඉදිරියේදී නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බව.	සුදුසු ක්‍රියාමාර්ග ගෙන ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් භුක්ති විඳින ඉඩම් 13 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදහස් දක්වා නොමැත	ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අඩු මිල ගණන් හා ප්‍රමාණාත්මක වගකීම් කාලයක් ලබා දී තිබූ ආයතන තිබියදී එම ආයතනවලින් මිලදී නොගෙන වෙනත් ආයතන දෙකකින් භාණ්ඩ මිලදී ගැනීම නිසා සභාවට රු. 3,824,424 ක පාඩුවක් සිදුවී තිබුණි.	ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමකින් තොරව විදුලි බුබුළු මිලදී ගැනීම මත ගුණාත්මකභාවය අඩුවීම හේතුවෙන් සභාවට අමතර පිරිවැයක් දැරීමට සිදුවන බව හා අවම මිල ගණන් යටතේ මිලදී ගැනීම් සිදු කිරීමට සිදුවන අවස්ථාවලදී ලැබෙන අයිතමයන් ගුණාත්මකභාවයෙන් ඉතා අඩු බව පෙනී ගිය අවස්ථා ඇති බව.	අවම පිරිවැයක් යටතේ ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 175 ක් පැවැතිණි.	මෙම සියලු පුරප්පාඩු සම්බන්ධව පළාත් සභාව දැනුවත් කර ඇති බව.	අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ස්ථිර වැටුප් ලබන රියදුරන් 36 ක් සිටියද එයින් 13 දෙනෙකු සේවයට වාර්තා කර සභා පරිශ්‍රයේ නොසිටි බව 2024 පෙබරවාරි 28 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී තහවුරු විය. ස්ථිර රියදුරුන් ඔවුන්ගේ රාජකාරිය නිසි පරිදි ඉටු නොකිරීම නිසා සභාව ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත රියදුරන් දෙදෙනෙකු බඳවා ගෙන එම රියදුරන් දෙදෙනාට 2024 මැයි 31 දින තෙක් රු. 601,600 ක් ගෙවා තිබුණි.	රියදුරන් 13 දෙනා විසින් රාජකාරියක් නොමැතිව ලබාගෙන ඇති අතිකාල එම සේවකයන්ගෙන් නැවත අයකර ගැනීමට කටයුතු සිදුකරන බව.	ස්ථිර රියදුරන් රාජකාරීවල යෙදවිය යුතු අතර ශ්‍රම මිලදී ගැනීම වළක්වාගත යුතුය.
(ඇ)	සේවක ණය රු. 5,700,607 ක් දීර්ඝ කාලයක සිට හිඟහිට පැවතුණි.	කමිටුවක් පත් කර ඇති අතර කමිටු තීරණය මත අවශ්‍ය පියවර ගැනීමට නියමිතව ඇති බව.	හිඟ සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය සහ 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/6 දරන ගැසට් පත්‍රයේ 8 වන නියෝගය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට වූ සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුගාමී මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ එදිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සභාවේ මූල්‍ය ප්‍රකාශන දින 118 ක් ප්‍රමාද වී 2025 ජුනි 27 දින ඉදිරිපත් කරන ලදී.	2026 වසරේ දී පෙබරවාරි 28 දිනට පෙර මූල්‍ය ප්‍රකාශ ලබා දීමට කටයුතු කරන බව.	ජාතික විගණන පනත හා ගැසට් විවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.2 වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වාර්ෂික අයවැය අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් පිළියෙළ කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි වර්ෂ අවසානයට ප්‍රගතිය දැක්වීමට කාර්යසාධන වාර්තාව පිළියෙළ කරනු වෙනුවට පාලන වාර්තාවක් පිළියෙළ කර ඉදිරිපත් කර තිබුණ ද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර්තව්‍යයන්වල ප්‍රගතිය පැහැදිලිව ඉදිරිපත් කර නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පිළිබඳව පාලන වාර්තාවේ අන්තර්ගතව ඇති බව.	ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර්තව්‍යයන්වල ප්‍රගතිය පැහැදිලිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

4.3 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැය විෂයයන් 272 ක් සඳහා සලසා තිබූ එකතුව රු. 148,411,000 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.	රජයේ ප්‍රතිපාදන හා පළාත් සභාවේ ප්‍රතිපාදන නොලැබීම වැනි හේතු මත සභාවේ වැය විෂයන්වල ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව.	අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය.
(ආ)	වැය විෂයයන් 42 ක් වෙනුවෙන් රු. 58,916,300 ක් වෙන්කර තිබුණද එයින් සියයට 75 කට වඩා වැඩි ප්‍රමාණයක් වැය කර නොතිබූ අතර එම ප්‍රමාණය රු. 51,139,364 ක් විය.	ඉදිරි වසර වලදී මේ සම්බන්ධව අවධානය යොමු කර කටයුතු කරන බව.	අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය.